# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 26 දරන හඟුරන්කෙත මාදන්වල
## රජමහා විහාර සංවර්ධන පදනම
## (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 මැයි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 මැයි මස 23 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 8.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

## 2013 අංක 26 දරන හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2013 මැයි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. (අයි. එන්. සී.) 20/2011.

''හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා ගෙන තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින්, සහ එකී පදනම සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 26 දරන හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනමේ දැනට සාමාජිකත්වය දරන තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනම'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද ඊට එරෙහිව ද සියලු අධිකරණවල නඩු පැවරීම හා පවරනු ලැබීමට ද පොදු මුද්‍රාව පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ බලය සහ අධිකාරය ද තිබිය යුතු ය. හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

2-PL 006079—2,590 (2011/06)

(අ) හඟුරන්කෙත, මාදන්වල, පිහිටා ඇති දැනට වසර සියයකට වඩා පැරණි ශ්‍රී ධර්මෝදය පිරිවෙන සහ මහා විහාරයේ සියලු ගොඩනැගිලි සංරක්ෂණය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් පිරිවෙන සහ මහා විහාරය ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම;

(ඇ) සංස්ථාවේ සාමාජිකයන්ගේ මෙන්ම වෙනත් ශ්‍රී ලාංකිකයන්ගේ යහපත උදෙසා සාමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික සහ සුභ සාධන වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඈ) උචිත කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් සහ ස්වයං රැකියා අරමුණු කරගත් වැඩසටහන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ දිළිඳු සහ උපකාර අවශ්‍ය ජනතාවගේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන, සංස්කෘතික කණ්ඩායම්, ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් ආයතන සහ සංවිධාන සමග සමීප සහයෝගයෙන් කටයුතු කිරීම.

(2) සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ දේශපාලන මතය මත පදනම් වූ කිසිදු විශේෂත්වයක් නොමැතිව සිදු කළ යුතු බවට සංස්ථාව වග බලා ගත යුතු ය.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ස්වකීය අරමුණු ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය වන හෝ කැමැත්ත දක්වන සියලු ක්‍රියා සහ කාරණා කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා බලය තිබිය යුතු අතර, පහත සඳහන් කරුණු ද ඊට ඇතුළත් විය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිළදී ගැනීම, අත්පත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හෝ වෙනත් ආකාරයකින් ලබා ගැනීම;

(ආ) අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ වෙනත් ආකාරයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම :

එසේ වුවද, සංස්ථාවට ලැබෙන සියලුම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විධායක කමිටුව විසින් මුදල් විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාර ගැනීම, ඒ සඳහා වට්ටම් දීම, පිටසන් කිරීම, හුවමාරු කිරීම, මිලදී ගැනීම, විකිණීම, සහ ඕනෑම බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ ගිණුම් වසා දැමීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් යම් පුද්ගලයකු හෝ ආයතනයක් සමග ගිවිසුම්, හවුල් ව්‍යාපාර හෝ එකඟතාවන්ට ඇතුළත්වීම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන්නා වූ අරමුදල් විධායක කමිටුව තීරණය කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීම, සේවයේ නියුක්ත කරවීම, සේවයෙන් පහ කිරීම, හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම මෙන්ම ඔවුන්ට සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම ;

(උ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී තැනැත්තන් පුහුණු කිරීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ යථා පරිදි සහ කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය අනෙකුත් සියලු දේ ඉටු කිරීම.

**5.** මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි චංචල

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

හෝ නිශ්චල හෝ යම් දේපළක් භාර ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව හා ශක්නුතාව සංස්ථාවට තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව සහ සංස්ථාවේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත් ව, සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**6.** (1) සංස්ථාවේ කටයුතුවල කළමනාකරණය සහ පරිපාලනය මේ පනතේ විධිවිධානවලට යටත්ව සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව ධුර දරන සාමාජිකයන් ගණනකින් යුක්ත වූ විධායක කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) බුද්ධශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට වඩා අඩු නොවන නිලයක් දරන තැනැත්තකු විධායක කමිටුව, නිලබලයෙන් පත්වන සාමාජිකයකු ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ විධායක කමිටුවේ ප්‍රථම සාමාජිකයන් මේ පනත ආරම්භ වන දිනයට ඉක්බිතිව ම වූ දිනයේ දී පදනමේ විධායක කමිටුවේ ධුරය දරන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) (අ) විධායක කමිටුවේ ධුර දරන්නකු, එකම ධුරයක් එක දිගට වසර තුනකට වඩා දරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද, එවැනි නිලධරයකු වසර දෙකක් ඉකුත්වීමෙන් පසුව, එම ධුරයට නැවත පත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අනුශාසක ධුරය ඇතුළු) විධායක කමිටුවේ ධුර දරන්නකු ලෙස කිසිම තැනැත්තකු එකම තනතුරක තම ජීවිත කාලය පුරාම ධුරය නොදැරිය යුතු බවට සැක දුරු කිරීමේ කාර්ය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින හා ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් පහත සඳහන් කරුණු අතුරින් යම් කරුණක් හෝ කරුණු කීපයක් සඳහා මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම, සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) කළමනාකරණ මණ්ඩලයේ නිලතල දරන්නන් තෝරාපත් කර ගැනීම හෝ නිලතල දරන්නන් විසින් ධුරය අත්හැර යාම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය, සහ කර්තව්‍ය සහ ඔවුන් පිළිබඳ නියම සහ කොන්දේසි ;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ, සංස්ථාවේ හෝ යම් උප කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ එම රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පුරප්පාඩු පිරවීම, එම රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍රය, එහි ගණපූරණය සහ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ සහ සංස්ථාවේ සාමාජිකයන් සඳහා වූ සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සාදන ලද රීතියක් ලෙස එවැනි රැස්වීමක දී එවැනි ආකාරයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සියලු කල්හි දී සංස්ථාවේ මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත් විය යුතු ය.

8\. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාව වෙත හෝ සංස්ථාව වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, වාරික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන මුදල් සංස්ථාවේ බැරට කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි එක් බැංකුවක, බැංකු කිහිපයක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් ස්වකීය ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව වාර්ෂිකව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ එකී ආයතනය මගින් ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා නිකුත් කරන ලද සහතික පත්‍රයක් දරනු ලබන තැනැත්තකු ; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

**10.** මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවැති සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනම වෙත ගෙවිය යුතු සියලු ණය වාරික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය. පදනමට අයවිය යුතු සහ පදනම විසින් ගෙවිය යුතු ණය මුදල්.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු විසින් සංස්ථාවේ ණය සහ වගකීම් ඉටුකිරීමේ කාර්යයන් සඳහා හෝ වෙනත් යම් කාර්යයන් සඳහා සංස්ථාව වෙත කලින් කල ගෙවිය යුතු සාමාජික ගාස්තු මුදල ඉක්මවනු ලබන්නා වූ යම් දායක මුදලක් ගෙවීම සඳහා යටත් නොවිය යුතු ය. සාමාජිකයන්ගේ වගකීම් සීමා සහිත වීම.

**12.** (1) සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු අතර, සංස්ථාවේ ලාභ හෝ ලාභාංශ ඇත්නම් එහි කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු ය. සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු බව.

(2) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරිවී තිබුණහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලැබුවා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**13.** සංස්ථාවේ විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. තව ද එකී අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**14.** විධායක කමිටුව විසින් එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් පිළියෙල කර එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ මාස හයක් ගතවීමට පෙර එම වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ බුද්ධ ශාසන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. වාර්ෂික වාර්තාව.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවක් මගින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.